# කොවිඩ් 19 - සති පාසල 10 ශ්‍රේණිය

## 8 වන පාඩම - මහනුවර රාජධානිය

සැකසුම - M.P.A ප්‍රදීප් කුමාර කෑ / දෙහි කිතලංගමුව ක . වි

- නිපුණතාවය - ශ්‍රී ලංකාවේ රජවරුන්ගෙන් ශ්‍රේෂ්ඨත්වය අගයමින් දේශීය උරුමය රැක ගැනීමට පෙළඹෙයි.
- නිපුණතා මට්ටම - මහනුවර රාජධානියේ පරිපාලන ක්‍රමවේදය සමකාලීන ආර්ථික සමකාලීන ආර්ථික සමාජ ක්‍රියාකාරීත්වය කාර්යක්ෂම වීමට දායක වූ ආකාරය පැහැදිලි කරයි
  විෂය සන්ධාරය / පාඩම - මහනුවර රාජධානිය

- ඉගෙනුම් ඵල -
  මහනුවර රාජධානියේ පරිපාලන ක්‍රමවේදය විස්තර කරයි.
  මහනුවර රාජධානියේ පළාත් බෙදීම් සිතියමක ලකුණු කරයි.
  මහනුවර රාජධානියේ පරිපාලන සංවිධානය ආර්ථිකය හා සමාජ කාර්යක්ෂමතාවට දායක වූ අයුරු පැහැදිලි කරන්න.

(3) ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් -

දුවේ පුතේ ඔබ 8 ශ්‍රේණියේ දී මහනුවර රාජධානිය පිළිබඳව පාඩමේ දී එම රාජධානියේ ආරම්භයත් එහි පාලකයින් පිළිබඳවත් තොරතුරු අධ්‍යනය කළා. එහිදී එහි පිහිටීම , ආරම්භය මහනුවර රාජධානියේ පාලකයින් සහ එම රාජධානියේ සුවිශේෂී ලක්ෂණ පිළිබඳව ඉගෙන ගත්තා. අද මෙම පාඩමෙන් මහනුවර රාජධානිය පිළිබඳ තවත් ගැඹුරින් සහ විස්තරාත්මකව තොරතුරු අධ්‍යනය කරමු. ඔබ 8 ශ්‍රේණියේ දී උගත් කරුණු ද මතක් කරමින් මෙහි එන කරුණු හා සසඳා බැලීමෙන් වඩාත් ගැඹුරු සහ විස්තරාත්මක අවබෝධයක් ලබා ගැනීමට උත්සහ කරන්න.

මේ අනුව සිතා බලා පහත ක්‍රියාකාරකම්වලද යෙදෙන්න. එහිදී පහළින් දක්වා ඇති අනෙකුත් පොත්පත් හා මූලාශ්‍රයන් ද අධ්‍යනය කරන්න.

(1) මහනුවර රාජධානියේ පරිපාලන සංවිධානයේ සැකැස්ම දළ රූප සටහනකින් ඇඳ දක්වන්න.

.

(2) උඩරට රාජධානියේ රජු සතුව පැවති බලතල සහ වගකීම් මොනවා ද?

(3) මහනුවර රාජධානිය තුළ ප්‍රධාන අධිකාරම්වරු දෙදෙනා යටතේ පාලනය වූ ප්‍රදේශ වෙන වෙනම ලියා ඔවුන් සතුව පැවති බලතල හා කාර්යයන් ලියා දක්වන්න.

(4) මහවාසල නිලධාරීන් යනුවෙන් හැඳින්වූයේ කවුරුන් ද? එම නිලධාරී පන්තියට අයත් වූ පිරිස නම් කර ඔවුන්ගේ කාර්යභාරයන් ලියා දක්වන්න.

(5) රට වසම හෙවත් ප්‍රාදේශීය පාලනය යටතේ උඩරට රාජධානිය බෙදා තිබූ දිසාවනි හා රටවසම් වෙන වෙනම ලියා දක්වන්න.

(6) රට හා දිසාව යන පාලන ඒකකයන්හි පරිපාලන කටයුතු සඳහා සම්බන්ධ වූ නිලධාරීන් නම් කරන්න.

**(7) බද්දේ සංවිධානය යනු කුමක් ද? ඒ යටතේ පැවති බද්දේ සංවිධාන මොනවා ද?**

**(8) උඩරට රාජධානියේ විහාර හා දේවාලගම් පාලනය සිදු වූයේ කෙසේ ද?**

**(9) මහනුවර රාජධානියේ අධිකරණ බලතල ක්‍රියාත්මක වූ ආකාරය සහ වැරදිකරුවන්ට ලබා දුන් දඬුවම් පිළිබඳ විස්තරයක් කරන්න.**

- ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාරී කර ගත හැකි පොත්පත් , වෙබ් අඩවි හා ඉගෙනුම් ආධාරක .
  දුවේ පුතේ ඔබට පහත සඳහන් වෙබ් අඩෙවි බැලීමෙන් සහ පහත පොත්පත් කියවීමෙන් මෙම පාඩමට අදාල තවත් තොරතුරු එකතු කරගැනීමට පුලුවන් .

  1) e - තක්සලාව

  2) e - නැණ පියස - http:/ www. enenapiyasa.lk

  3) You tube නාලිකාවේ මහනුවර රාජධානියට අදාල මාතෘකා සඳහා ඇති තොරතුරු

  4) පොත්පත් - 8 ශ්‍රේණිය සහ 10 ශ්‍රේණිය පෙළපොත් - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තුමේන්තුව

  අ . පො . ස ( උ . පෙළ ) ශ්‍රී ලංකාවේ ඉතිහාසය II කොටස - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තුමේන්තුව

  ශ්‍රී ලංකාවේ ඉතිහාසය II වෙළුම - ඇම් . ඩී ගුණසේණ සහ සමාගම

  IV වෙළුම

  එදා හෙළ දිව - රොබට් නොක්ස්

  ඩේවි දුටු ලංකාව - ජෝන් ඩේවිඩ්